# පුරාණ අනුරාධපුරයෙහි බෞද්ධ සංඝාරාම ආශ්‍රිතව පැවති සනීපාරක්‍ෂක කටයුතු පිළිබඳ සිදුකෙරෙන පුරාවිද්‍යාත්මක අධ්‍යයනයක්

එම්.ආර්.ටී.ධර්මසිරි[36]

අනුරාධපුර තාක්‍ෂණික හා සංස්කෘතික අවධි බෙදා වෙන්කර ඇති ආකාරයටප්‍රාග් ඓතිහාසික, මූල ඓතිහාසික, මුල් ඓතිහාසික, මධ්‍ය ඓතිහාසික, යනාදී වශයෙන් හඳුනාගත හැකි ය. ඓතිහාසික අවධියේ දී වඩාත් වැදගත් සංදිස්ථානයක් වන්නේ අනුරාධපුර රාජධානිය ක්‍රියාත්මක වූ අවධිය යි.අනුරාධපුරය කේන්ද්‍රකර ගනිමින් මෙ රට තුළ විශිෂ්ට සභ්‍යත්වයක්, සංස්කෘතියක් නිර්මාණය වීමට බලපානු ලබන්නේ තාක්‍ෂණික සංස්කෘතික අවධි අඛණ්ඩ ව මෙම ප්‍රදේශයේ ක්‍රියාත්මක වීම හේතුවෙනි. විධිමත් පරිපාලන තන්ත්‍රයක්, විධිමත් ආර්ථිකයක් මෙන් ම සංවිධිත ආගමික සංහිඳියාවක් ද අනුරාධපුර රාජධානිය මූලික කර ගෙන නිර්මාණය වී ඇත. බුදු දහම රාජ්‍ය අනුග්‍රහය මධ්‍යයේ වර්ධනය වීමත් සමඟ නොයෙකුත් බෞද්ධ ආගමික වෙහෙර විහාර නිර්මාණය වන්නට විය. බෞද්ධ දර්ශනය හා වත්පිළිවෙත් ගුරුකොට ගනිමින් ආගමික ගොඩනැගිලි ඉදිකිරීමට මූලික පරමාදර්ශය විය. පුරාණ බෞද්ධ සංඝාරාම අතර මහාවිහාර, පබ්බතවිහාර හා පධානඝර වශයෙන් ගොඩනැගුන වෙහෙර විහාරරාශියක් අනුරාධපුරය කේන්ද්‍රස්ථානය කරගනිමින් ඉදිකර ඇත. අතීතයේ අනුරාධපුරය සියලු ම අංගෝපාංගයන්ගෙන් සමන්විත ව තිබූ හෙයින් වැදගත් සංස්කෘතික මධ්‍යස්ථානයක් වශයෙන් වර්ධනය වන්නට ඇති බව පැහැදිලිය.දේවානම් පියතිස්ස රජු විසින් මෙ රට තුළ බුදු දහමට අනුග්‍රහ දැක්වීමත් සමග රාජ්‍යය අනුග්‍රහයෙන් සෑම රජෙකු විසින්ම ලෝක ශාසනය ආරක්‍ෂා කිරීම සිය පරම යුතුකම වශයෙන් රජු සලකා ඇත.භික්‍ෂූන් වහන්සේලා දහස් සංඛ්‍යාත පිරිසක් අනුරපුරයෙහි වැඩ විසූ අතර රජු විසින් එම භික්‍ෂූන් වහන්සේලාගේ සියලු අවශ්‍යතාවයන් රාජ්‍ය අනුග්‍රහය යටතේ සිදුකරන්නට ඇත. රාජ්‍ය අනුග්‍රහය යටතේ සිදුකර ඇති ඉදිකිරීම්වල භික්‍ෂූන් වහන්සේලාගේ සනීපාරක්‍ෂක කටයුතු සඳහා සිදුකළ ඉදිකිරීම් ද ඉතාමත් වැදගත් වේ. සනීපාරක්‍ෂක කටයුතු වශයෙන් සලකනු ලබන්නේ යම්කිසි පිරිසකගේ ශාරීරික අවශ්‍යතා හා ලෙඩරෝග පාලනය සඳහා ක්‍රියාත්මක වන අවශ්‍යතාවයන් පහසුවෙන් හා විධිමත්ව සලසා ගැනීම පිණිස සිදුකරනු ලබන කළමනාකරණයබව පෙන්වාදිය හැකිය. සනීපාරක්‍ෂක කටයුතු සඳහා අවශ්‍ය ඉදිකිරීම්වලදී බෞද්ධ සංඝාරාම ආශ්‍රිත ව බෞද්ධ දර්ශනයේ විනය අනුව යමින් ගොඩනැගිලි ඉදිකර ඇතිබව පෙනේ. පැරණි අනුරාධපුරය කේන්ද්‍රකරගනිමින් නිර්මාණය වී ඇති බෞද්ධ සංඝාරාම ආශ්‍රිතව ඉදිකර ඇති සනීපාරක්‍ෂක කටයුතු අතර **ජන්තාඝර, පොකුණු, භූ ගත නළ මාර්ග හා වැසිකිළි හා කැසිකිළි** රාශියක් තිබේ. මෙම අධ්‍යයනයේ දී අවධානය යොමුකරනු ලබන්නේ ඉහත අංශ කෙරෙහි ය. අනුරාධපුර දිස්ත්‍රික්කයෙහි පැරණි බෞද්ධ සංඝාරාම ආශ්‍රිත සනීපාරක්‍ෂක ඉදිකිරීම්වල වාස්තුවිද්‍යාව, තාක්‍ෂණය හා උපයෝගීතාවය කුමන ආකාරයෙන් ක්‍රියාත්මක වූයේ ද යන්න පිළිබඳ ව අණාවරණය කිරීම මෙම අධ්‍යයනයේ දී සිදුකරනු ඇත. අතීතයේ මිනිසා පරිසරයත් සමඟ පැවැත් වූ සහසම්බන්ධතාවය, ජලයත් සමඟ පැවති සම්බන්ධතාවය කෙබඳු ආකාරයෙන් සනීපාරක්‍ෂක කටයුතු සඳහා භාවිත වූයේ ද යන්න හඳුනාගැනීමට ඉන් හැකියාව ලැබේ.

ප්‍රමුඛ පදඃ පධානඝර, සනීපාරක්ෂක කටයුතු

[36]පුරාවිද්‍යා හා උරුම කළමනාකරණ අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය, mrtdharmasiri@gmail.com.